## අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය
### උපදෙස් පත්‍රිකාව

## පාලි ගාථා රචනා තරගය

1. මෙම තරගය ජ්‍යෙෂ්ඨ අංශය සඳහා පමණක් පැවැත්වේ. දෙනු ලබන මාතෘකාවකට අනුව තමන් කැමති වෘත්තයකින් එම මොහොතේදී ම පද්‍ය නිර්මාණය කිරීමට තරගකරුවන්ට සිදු වේ.

1.1. අභිමතාර්ථ

1. පාලි භාෂා නිපුණතාව ලබාගන්නා අතර ම ගාථා රචනය සඳහා නැඹුරු කිරීම.
2. ගාථා රචනයට අවශ්‍ය ශාස්ත්‍රීය මූලධර්ම ඉගෙනීමට හා විවිධ වෘත්ත හඳුනා ගැනීමට පෙළඹවීම.

1.2. තරග කොන්දේසි

1. තරගකරුවන් කැමති වෘත්තයකින් හෝ වෘත්ත කිහිපයකින් ගාථා 06ක් රචනා කළ යුතු ය.
2. එම මොහොතේ ලබාදෙන මාතෘකාවන්ගෙන් තෝරාගත් මාතෘකාවක් අනුව ගාථා නිර්මාණය කළ යුතු ය.
3. ගාථා ස්ව නිර්මාණ විය යුතු ය.
4. තරගකරුවන් සඳහා ලැබෙන කාලය පැය 01කි.
5. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.
6. ජාතික මට්ටම දක්වා ම පහත මාතෘකා පැවතේ.
   - I. ජාතික නායකයින්
   - II. ආගමික උත්සව
   - III. ආගමික ප්‍රබෝධයේ නිර්මාතෘවරු
   - IV. පිරිවෙන් අධ්‍යාපනය
   - V. මහින්දාගමනය හා ද්‍රුමින්දාගමනය
   - VI. ශ්‍රේෂ්ඨ රජවරු
   - VII. අටුවාචාරීන්
   - VIII. මව්බිමේ අසිරිය
   - IX. දළදා වහන්සේ
   - X. පාලි පොතපත

1.3. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | ගාථාවේ අන්තර්ගතය | 10 |
| 2. | පාලි භාෂාව හැසිරවීම | 10 |
| 3. | නිර්මාණ කුසලතාව | 10 |
| 4. | මාතෘකාවට උචිත බව | 10 |
| 5. | වෘත්ත රැකීම | 10 |
| | මුළු ලකුණු | 50 |